{සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
## மாகாணக் கல்வித்திணைக்களம்- வடமத்திய மாகாணம்
## Department of Education – North Central Province

| 08 - ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | කාලය : පිළිතුරු පත්‍රය |
|---|---|---|

විෂයය :- නාට්‍ය හා රංගකලාව

පාසලේ නම :- ...............................................................

ඇතුළත්වීමේ අංකය :- ...............................................................

## උත්තර පත්‍රය

## I කොටස

01. I
02. I
03. I
04. IV
05. III
06. III
07. I
08. II
09. III
10. II
11. එම්.ඇල්. ද සිල්වා ගුරුමුහන්දිරම්
12. භාව ප්‍රකාශන
13. බුද්ධ ගජ්ජය
14. සුගතපාලද සිල්වා
15. අභිනය
16. සැහැල්ලු කිරීම
17. පබාවතී
18. අමර ගියා දිව්‍යලෝකෙ
19. ශරීරය උණුසුම් කිරීම
20. පැටී අඬන්නේ මොනවටදෝ බොල

(ලකුණු 20 x 2 = 40)

**

## II කොටස

01.

I. ඩී. කුමාරගේ (ලකුණු 1)

II.

- ළමුන් පවා තමන්ගේ වයසට දැනගත යුතු දේ බොහෝමයක් ඇති බව.
- නපුරු නරක ළමයි සැම විටම ප්‍රතික්ෂේප වේ.
- අවිහිංසාවාදයේ වැදගත්කම.

(නිවැරදි එක් තේමාවකට ලකුණු ලබාදෙන්න.) (ලකුණු 1)

III. වලහා (ලකුණු 1)

IV. මී මැස්සෝ (ලකුණු 1)

V. ආච්චිට මී වද යැවීමට අවශ්‍යය බව පවසා මී වද පෙට්ටියේ නැඟී නිවසට යාමට. (ලකුණු 2)

VI.

- බාහිර චරිත ලක්ෂණ : නපුරුයි, භයංකරයි, සතුන්ට හිංසා කරයි.
- අභ්‍යන්තර චරිත ලක්ෂණ : ආත්මාර්ථකාමියි, මෝඩයි, බොළඳයි, රැවටෙයි. (ලකුණු 2)

02.

I. අභිරූපණය යනු සංවාද භාවිතයෙන් තොරව ආංගික හා සාත්වික අභිනය මඟින් කිසියම් සිද්ධියක් හෝ අවස්ථාවක් නිරූපණය කිරීමයි.

(ලකුණු 2)

II.

- මූලිකව යොදා ගන්නා අභිනය - ආංගික අභිනය
- යොදා නොගන්නා අභිනය - වාචික අභිනය (ලකුණු 3)

III.

- අභිරූපණයේ වෙස් ගැන්වීම ඉතා සුවිශේෂී ලෙස සිදු කරයි.
- මුහුණේ උපාංග වඩාත් ඉස්මතු වන ආකාරයට මුහුණේ ආලේපන ගල්වයි.
- මුහුණ සුදු පැහැයෙන්ද, ඇහිබැම කලු පැහැයෙන්ද, තොල් රතු වර්ණයෙන් වර්ණ ගන්වයි.
  (සුදුසු රූප සටහනක් ඇද කරුණු කෙටියෙන් දක්වා ඇත්නම් ලකුණු ලබා දෙන්න) (ලකුණු 3)

03.

I. අනුශාංගික කලාව යනු නාට්‍යයක සාර්ථකත්වයට හා නලු කාර්ය සාර්ථක කර ගැනීමට යොදා ගනු ලබන වෙනත් කලා අංග වේ. (ලකුණු 2)

II.

- වේෂභූෂණ, අංග රචනය, පසුතල නිර්මාණය, රංගාලෝකය, නාට්‍ය සංගීතය, රංග වින්‍යාසය
  (නිවැරදි පිළිතුරු 03 ක් සඳහා ලකුණු ලබා දෙන්න) (ලකුණු 3)

III. වේෂභූෂණ නිර්මාණයේදී සැලකිලිමත් වියයුතු කරුණු : චරිත ස්වභාවය, නාට්‍යයට අදාල කාලය, දේශය, යුගය, නාට්‍ය ශෛලිය, අනෙකුත් අනුශාංගික කලා හා වර්ණ සමග ගැලපීම, පහසුවෙන් ඇද පැලඳ ගැනීමට හා ගැලවීමට හැකි වීම, අවම පිරිවැයකින් නිර්මාණය කිරීම.
(ඕනෑම එක් අනුශාංගික කලාවකට අදාල ලෙස කරුණු දක්වා තිබේනම් ලකුණු ලබා දෙන්න.) (ලකුණු 3)

04.

I. ඕනෑම ආගමික, (බෞද්ධාගමික, කතෝලික, ඉස්ලාමීය) සාහිත්‍යයක ඇති කතා (ලකුණු 2)

II. කඳා වළලු (සේරිවාණිජ ජාතකය), පබාවතී (කුස ජාතකය), මනමේ (චුල්ල ධනුද්දර ජාතකය), ලෝමහංස (ලෝමහංස ජාතකය), සඳකිඳුරු (සඳකිඳුරු ජාතකය)
(නිවැරදි පිළිතුරු 03 කට ලකුණු ලබාදෙන්න. ) (ලකුණු 3)

III. නිවැරදි සිසු පිළිතුරට අදාලව ලකුණු ලබා දෙන්න. (ලකුණු 3)

05.

I. රංග ක්‍රීඩා යනු තරඟකාරී ස්වභාවයෙන් ඉදිරිපත් කරන, නලු රංගනයට අවශ්‍යය කායික මානසික සූදානම ඇති කරවන නලු නිළියන් පුහුණු කරවන ක්‍රීඩා වේ.
(නිවැරදි නිර්වචනයකට ලකුණු ලබා දෙන්න) (ලකුණු 2)

II.

- සාමූහිකත්වය වර්ධනය වීම.
- අවධානය ප්‍රගුණ වීම.
- ඉවසීම වර්ධනය වීම.
- ක්ෂණික තීරණ ගැනීමට හැකිවීම.
- ජය පරාජය විඳ ගැනීමට හැකිවීම.
- සන්නිවේදන හැකියාවන් වර්ධනය වීම.
- නායකත්වය වර්ධනය වීම.
- නායකත්වයට ගරු කිරීම.

(නිවැරදි පිළිතුරු 03 කට ලකුණු ලබා දෙන්න) (ලකුණු 3)

III. සිසුවා රංග ක්‍රීඩාවක් සිදුකල ආකාරය නිවැරදිව පියවරෙන් පියවර දක්වා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබාදෙන්න. (ලකුණු 3)

06.

I. නාට්‍ය පෙලක් යනු යම්කිසි සිද්ධියක්, අවස්ථාවක්, අත්දැකීමක් ඔස්සේ නාට්‍ය නිර්මාණය කිරීම සඳහාම ලියන ලද සාහිත්‍යමය ලියවිල්ල වේ. (ලකුණු 2)

II. චරිත, සංවාද, රංග විධාන, නාට්‍ය තේමාව, ගැටුම්, නාටයෝචිත අවස්ථා.
(නිවැරදි පිළිතුරු 03 කට ලකුණු ලබා දෙන්න) (ලකුණු 3)

III.

- කතාවේ ඇති අවස්ථා හා සිද්ධි නාට්‍යයට උචිත පරිදි සකස් කිරීම.
- ප්‍රභල සංවාද නිර්මාණය කිරීම.
- නාට්‍යයට උචිත හා ප්‍රභල චරිත නිර්මාණය කිරීම.
- තේමාව මනාව ඉස්මතුවන ආකාරයට නිර්මාණය කිරීම.
- ගැටුම මනාව වර්ධනය වන ලෙස නිර්මාණය කිරීම.
- කථාවේ මූලික හරයට හානි නොවන පරිදි නාට්‍ය පෙල නිර්මාණය කිරීම.
- කථාවේ මුල, මැද, අග සම්බන්ධතාවය රැකෙන පරිදි නාට්‍ය පෙල සකස් කිරීම.

(නිවැරදි කරුණු සඳහා සම්පූර්ණ ලකුණු ලබා දෙන්න) (ලකුණු 3)

07.

I. කතා පුවත මනාව ගොනු කර ගනිමින් චරිත, දෙබස්, රංග විධාන, නාටයෝචිත අවස්ථා සහිතව පෙල රචනා කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 8)

***